**ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**

# පුරප්පාඩු

## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ ජනරාල්
## (පුරප්පාඩු 01)

**(1) රැකියා විස්තරය**

අධ්‍යක්ෂ ජනරාල් ආයතනයෙහි ඉහළම මට්ටමේ විධායක නිලධාරියා වන්නේය.

ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දෙනු ලබන බලතල, කාර්යයන් හා වගකීම් එම අධ්‍යක්ෂ මණ්ඩලයේ මගපෙන්වීම හා පරිපාලනය යටතේ ඉටුකරමින් ආයතනික කාර්ය මණ්ඩලයට නායකත්වය දෙමින් ද, කාර්ය මණ්ඩලය දිරිගන්වමින් ද, ආයතනය ඉහළම ඵලදායිතාව කෙරෙහි යොමු කරවීමද, ආයතනයෙහි සමස්ථ කාර්යය සාධනය සම්බන්ධයෙන් මූලික වගකීම හා වගකීම් දැරීම ද, ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් තනතුර දරන අයට පැවරෙන කාර්යභාරය වේ.

**(2) සුදුසුකම් හා පළපුරුද්ද**

(2.1) බාහිර අයදුම්කරුවන්

(අ) විද්‍යා / වෛද්‍ය විද්‍යා / ව්‍යාපාර පරිපාලනය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

විද්‍යා/ වෛද්‍ය විද්‍යා / ව්‍යාපාර පරිපාලනය යන විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරු වල අවම වශයෙන් වසර 20 ක පළපුරුද්ද (අවම වශයෙන් මින් වසර 5 ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.)

හෝ

(ආ) විද්‍යා / වෛද්‍ය විද්‍යා / ව්‍යාපාර පරිපාලනය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

විද්‍යා / වෛද්‍ය විද්‍යා / ව්‍යාපාර පරිපාලනය යන විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

සහ

ආචාර්ය උපාධියක් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 05 ක විශිෂ්ඨ සේවා වාර්තාවක් ගත් නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද

(2.2) අභ්‍යන්තර අයදුම්කරුවන්

ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ශ්‍රේණියෙහි HM 1-1 තනතුරක අවම වශයෙන් වසර 05 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සමග

බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහිලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහිලා නිශ්චිත ප්‍රවීණතාව

**(3) වැටුප් පරිමාණය**

HM 2-1-2016 - (රු.93, 020 - 12×2,700 - රු.125,420)

**(4) වයස**

අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**(5) බඳවා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**(6) කොන්දේසි**

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

(I) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(II) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

(III) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

❖ අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්පත්,සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

❖ අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

(අපේක්ෂකයින් විසින් 8% ක් හා ආයතනය විසින් 12% ක් අර්ථසාධක අරමුදල සඳහා සහ 3%ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ද දායක වනු ඇත.)

❖ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමය

අයදුම්කරුවන් විසින් සහතිකපත්, චරිත සහතික වල පිටපත්, ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ

දුරකථන අංකද සමග තම ජීව දත්ත තොරතුරු 2023.06.08 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, 363/12, සුගතදාස ස්ටේඩියම් - බ්ලොක් ඩී, ක්‍රීඩා සංකීර්ණ රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

❖ එසේ නොවින සහ අයදුම්පත් භාර ගන්නා දිනට පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

❖ රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ අදාල ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන ලද තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය.**
**011-3071838**